# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 61 දරන
# මහජන බැංකු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 ජනවාරි මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 35 යි　　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1980 අංක 61 දරන මහජන බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 29 වන දින]

එල්.ඩී.—ඕ. 20/80

## 1961 අංක 29 දරන මහජන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1980 අංක 61 දරන මහජන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 25 දරන මහජන බැංකු (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 1961 අංක 29 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරයන් දස දෙනකුගෙන් මණ්ඩලය සමන්විත විය යුතු අතර, ඒ අධ්‍යක්ෂවරයන්ගෙන් දෙදෙනකු සමුපකාර විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" ප්‍රාග්ධනය.

12. (1) බැංකුවේ අනුමත ප්‍රාග්ධනය, එක් එක් කොටස රුපියල් පනහක් වන්නා වූ කොටස්, කෝටි දෙකකට බෙදනු ලැබූ රුපියල් කෝටි සියයක් විය යුතු ය.

(2) බැංකුවේ ගෙවා නිමි ප්‍රාග්ධනය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් ප්‍රමාණයක් විය යුතු ය.".

4. 42 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 42අ වගන්තිය ලෙස බල පැවැත්විය යුතු ය :— 42අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

" අමාත්‍යවරයා විසින් විධාන දෙනු ලැබිය හැකි බව.

42අ. බැංකුවෙහි කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලය වෙත ලියවිල්ලකින් දෙනු ලැබිය හැකි අතර, එම විධාන අනුව ක්‍රියා කිරීම මණ්ඩලයෙහි කාර්ය විය යුතු ය.".

2—ඒ 53836—13,500 (81/01)